# මිනිස් හැසිරීම් තුළ දැකිය හැකි භාහිර චලන ඉරියව් සහ හැඩතල

රංගනයේ දී අපට සමාජයේ හමුවන ඕනෑම චරිතයක් රගදැක්වීමට සිදුවේ. ඒ සඳහා අපට හමුවන පුද්ගල චරිත පිළිබඳ අප දැන සිටිය යුතුය. ඔවුන් පිළිබඳ හොඳින් නිරීක්ෂණය කළ යුතුය. එවැනි චරිත අතර,

- මාළු වෙළෙන්දා
- ගුරුවරයා
- වෛද්‍යවරයා
- හමුදා සෙබළා
- මන්ත්‍රී ආරක්ෂකයා
- බස් කොන්දොස්තර

## මාළු වෙළෙන්දා



- නිතරම මාළු කපන පිහි ආදිය අතින් ගෙන සිටී.
- මාළු මාළු යනුවෙන් නිතරම කෑගසයි.
- මාළු විකිණීම කැපීම ආදිය සිදුකරයි.
- සරමක් බැනියමක් හෝ කොට කලිසමක් ඇද සිටී.

## හමුදා සෙබළුන්



- ආවේණික නිම් ඇඳුම් ඇත.
- මනා පෞරුෂයකින් යුක්තයි.
- ගිනි අවි අතදරා සිටින අවස්ථා දැකිය හැක.
- හදිසි අවස්ථා වලදී ඉතා ඉක්මණින් ක්‍රියා කරයි.

## බස් කොන්දොස්තර



- ටිකට් කඩන යන්ත්‍රයක් භාවිත කරයි.
- මගීන්ගෙන් මුදල් අයකරයි.
- බස්රථ තුළ කෑගසමින් ඒ මේ අත ගමන් කරයි.

## ගුරුවරියක්

- සාරියකින් සැරසී සිටී.
- ප්‍රියමනාප චරිතයකි.
- දරුවන්ට ආදරය කරුණාව දක්වයි.
- පොත් අතින් රැගෙන සිටී.



මෙවැනි චරිතවල ස්වාභාවය, ඔවුන් භාවිත කරන උපකරණ, ඔවුන්ගේ භාෂාව හා කටහඬ ඔවුන්ගේ හැසිරීම් රටාව පිළිබඳ අපට අධ්‍යනය කළ හැකිය. ඒ අනුව අපට මිනිස් චර්යාවන් අනුකරණය කර පෙන්විය හැකිය. එම චරිත හොඳින් නිරීක්ෂණය කිරීම තුළින් අපට මිනිස් චරිත හොඳින් අනුකරණය කළ හැකිය. රංගනයේ දී අපට අනුකරණය ඉතා වැදගත් සංකල්පයකි.

ක්‍රියාකාරකම ;

සමාජයේ ඔබට හමුවන අනුකරණය කළ හැකි චරිත හොඳින් නිරීක්ෂණය කර එම චරිත ඇතුළත් පොත් පිංචක් හදන්න

ගුරුවරයෙක්, හිගන්නෙක්, භිකෂුවක්, හෙදියක්, ළමයෙක්, වෛද්‍යවරයෙක්, නඩුකරයෙක්, ගොවියෙක් ආදී විවිධාකාර භූමිකා කිහිපයක් රඟ දක්වන්න.